FORB Learning Platform

# Script: Freedom of Religion or Belief – an introduction

## ආගම ඇදහීමේ හා විශ්වාස දැරීමේ නිදහස පිළිබඳ හැඳින්වීමක්

මේ, සිතීමේ, හෘද සාක්ෂියේ, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස කියන මානව අයිතිවාසිකම කියන්නේ මොකක්ද, එය සීමා කරන්න පුළුවන් ද, ඒ කුමන අවස්ථාවලද කියන කාරණාව සම්බන්ධයෙන් සලකාබලන ඉදිරිපත් කිරීම් අටකින් පළමුවැන්න යි. මානව අයිතිවාසිකම් මගින් ආරක්ෂා කරන්නේ කවුරුන්ද නැතහොත් මොනවාද කියන කාරණාවත් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතියෙන් අපට ලැබෙන්නේ මොනවාද කියන කාරණාවත් අපි මේ කෙටි හැඳින්වීම තුළ සලකා බලනවා.

මුලින්ම, මම ඔබෙන් ප්‍රශ්නයක් අහන්න කැමතියි! ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස කියන මානව අයිතිවාසිකමෙන් ආරක්ෂා කර දෙන්නේ මොන ආගම්ද?

ඒ, ලෝකයේ ප්‍රධාන ආගම් ද?

නැතිනම්, කුඩා සහ අසාමාන්‍ය ආගම් ද ඇතුළුව සියළුම ආගම් ද?

එහෙමත් නැතිනම් සියළුම ආගම් සහ සියළු ආකාරවල විශ්වාස ද?

ඇත්තෙන්ම, ඒක ප්‍රයෝගකාරී ප්‍රශනයක්. මොකද, මම ඔබෙන් ඇහුවේ ආරක්ෂා වෙන්නේ මොන ආගම් ද කියන කාරණාව. බොහොම වෙලාවට මිනිසුන් හිතන්නේ මේ අයිතිවාසිකමින් ආරක්ෂා කරදෙන්නේ ආගම් සහ විශ්වාස කියලායි. ඒත් ඒක එහෙම නෙවෙයි! අනෙක් සියළුම මානව අයිතිවාසිකම් වාගේම මේ අයිතිවාසිකමෙන් ආරක්ෂා කර දෙන්නේ මිනිසුන්ට ආගම ඇදහීමටත් විශ්වාස දැරීමටත් තිබෙන නිදහස මිස ඒ ආගම් හෝ විශ්වාස නොවෙයි.

ආගම් ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසෙන් ආරක්ෂා කර දෙන්නේ, පැරණි ආගම්, අළුත් ආගම්, රටවල්වල සම්ප්‍රදායික ආගම්, ඒ වගේම රටවල්වල සම්ප්‍රදායික නොවන ආගම් තමන්ගේ කියා හඳුනාගන්නා, විශ්වාස කරන හෝ ප්‍රගුණ කරන මිනිසුන්වයි. ඒ වගේම, ආගමික නොවන විශ්වාස දරන අද්වේවාදීන්, මානවවාදීන් සහ ශාන්තිවාදීන් වැනි අයත් මෙම අයිතිවාසිකමෙන් ආරක්ෂා කර දෙනවා. කොයි රටක සිටියත් ඔවුන්ට මේ ආරක්ෂාව ලැබෙනවා.

ආගම් සහ විශ්වාස ගැන සැලකිල්ලක් නැති පුද්ගලයින්වත් මේ ආගම ඇදහීමේ හා විශ්වාස දැරීමේ අයිතිවාසිකමෙන් ආරක්ෂා කර දෙනවා.

ඒ කියන්නේ, ආගම ඇදහීමේ හා විශ්වාස දැරීමේ අයිතිවාසිකමෙන් හැමදෙනාම ආරක්ෂා කර දෙනවා! එහෙමනම්, අපට මෙයින් ලැබෙන ආරක්ෂාවන් නැතිනම් අයිතිවාසිකම් මොනවාද? මේ ගැන දැනගන්න නම් අපි ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රකාශන සහ සම්මුති දිහා බලන්න ඕනෑ. මෙතනදී වැදගත්ම වෙන දෙකක් තමයි:

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 18 වැනි වගන්තිය; සහ

එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 18 වැනි වගන්තිය.

එක්සත් ජාතීන්ගේ ප්‍රකාශ හරහා දේශපාලන අභිලාශ ප්‍රකාශයට පත්වෙනවා, එක්සත් ජාතීන්ගේ සම්මුති සහ ප්‍රඥප්ති කියන්නේ නීතිමය බැඳීමක් ඇති ලේඛන. දැන් අපි සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය දිහා බලමු.

**18 වැනි වගන්තිය**

1. සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ සහ ආගම ඇදහීමේ නිදහස සෑම කෙනෙකුටම තිබිය යුතුය. තමන් තෝරාගන්නා ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හෝ පිළිගැනීමට ඇති අයිතිය සහ තනිවම හෝ අන්‍යයින් සමගින් එක්ව, සහ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව සිදුකරන වන්දනාමාන, පිළිපැදීම, ප්‍රගුණ කිරීම හා ඉගැන්වීම හරහා තමන්ගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය මෙම අයිතිවාසිකමට ඇතුළත් වේ.

2. තමන් තෝරාගන්නා ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හෝ පිළිගැනීමට පුද්ගලයකුට ඇති අයිතියට හානි කරන අන්දමේ බලහත්කාරයකට කිසිදු පුද්ගලයකු ලක් නොකළ යුතු ය.

3. යමෙකුගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය සීමා කළ හැක්කේ නීතියෙන් නියම කර ඇති අන්දමට සහ මහජන ආරක්ෂාව, සාමය, සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීමට හෝ අන්‍යයින්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීමට පමණක් වේ.

4. මේ සම්මුතියට පාර්ශවකරුවන් වන රාජ්‍ය, තමන්ගේ අවබෝධය සමගින් අනුකූල වන්නා වූ ආගමික හා සදාචාර අධ්‍යාපනයක් තමන්ගේ දරුවන්ට ලැබෙන බව සහතික කරගැනීම සඳහා මවුපියන්ට සහ, අදාළ වන කල්හි භාරකරුවන්ට ඇති නිදහස සඳහා ගරුකිරීමට පොරොන්දු වනු ලැබේ.

හොඳයි, මෙයින් ආරක්ෂාව ලැබෙන පුද්ගලයින්ට ප්‍රායෝගිකව මින් අදහස් වන්නේ මොනවාද? අපට තිබෙන අයිතිවාසිකම් මොනවාද? ආගම හා විශ්වාස සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතියෙන් ලබා දී තිබෙන අයිතිවාසිකම් අවධාරණය කරන මාතෘකා හතක් ඔබට හඳුන්වාදෙන්න මම කැමතියි:

මෙහි මුල් අයිතිවාසිකම් දෙකෙන් තමයි ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසේ මූලික හරය නිර්මාණය වෙන්නේ:

- ආගමක් හෝ විශ්වාසයක් ඇතිව සිටීමට, තෝරාගැනීමට, වෙනස් කිරීමට හෝ හැරයාමට ඇති නිදහස; සහ
- ආගමක් හෝ විශ්වාසයක් ප්‍රගුණ කිරීමට හෝ ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.

ඊට අමතරව,

- බලහත්කාරයට ලක්වීමෙන් ආරක්ෂා වීමේ;
- ආගම හෝ විශ්වාස සම්බන්ධ කාරණාවලදී වෙනස්කොට සැලකුම් නොලැබීමේ;
- ආගම හා විශ්වාස සම්බන්ධයෙන් මවුපියන් සඳහා සහ දරුවන් සඳහා;
- හෘදසාක්ෂියට අනුව විරුද්ධ වීමේ;

අයිතීන් අපට හිමියි.

හිමිකර දී ඇති අයිතිවාසිකම් සීමාකළ හැකිද, ඒ කුමන අවස්ථාවලද යන කාරණය, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතියට සම්බන්ධ තවත් වැදගත් අංගයක්.

අදාළ අයිතිවාසිකමෙන් ප්‍රායෝගිකව අදහස් වන්නේ කුමක්දැයි ගැඹුරින් සලකා බලන්නට මේ එක් එක් මාතෘකාව සම්බන්ධයෙන් සැකසූ වීඩියෝ පට ඔබට වෙබ් අඩවියේ බලාගන්නට පුළුවන්.

Copyright: SMC 2018